# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2030/47 - 2017 අගෝස්තු මස 04 වැනි සිකුරාදා - 2017.08.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2016

### 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වන වගන්තිය සමග කියවිය යුතු 142 වන වගන්තිය යටතේ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**වෛද්‍ය රාජිත සේනාරත්න,**
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය.

2017 අගෝස්තු මස 04 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2017 අංක 05 දරන වෛද්‍ය උපකරණ මිල නියම කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කිසිදු නිෂ්පාදකයකු, ආනයනකරුවකු, බෙදාහරින්නකු, වෙළෙන්දකු, සැපයුම්කරුවකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු යම් වෛද්‍ය ආයතනයක් හෝ යම් වෛද්‍ය උපකරණ සන්තකයේ දරන්නකු විසින් මෙහි උපලේඛනයේ වෙළෙඳ නාමයෙන් හෝ අනුමත නාමයෙන් විස්තර කර දක්වා ඇති යම් වෛද්‍ය උපකරණයක් එහි දක්වා ඇති උපරිම සිල්ලර මිලට (MRP) වඩා වැඩි මිලකට අලෙවි කිරීම, අලෙවි කිරීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ඒ සඳහා අයකිරීම නොකළ යුතු ය.

3. නිෂ්පාදකයකු, ආනයනකරුවකු, බෙදාහරින්නකු, වෙළෙන්දකු, සැපයුම්කරුවකු, ඖෂධ වේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු යම් වෛද්‍ය ආයතනයක් හෝ යම් වෛද්‍ය උපකරණ සන්තකයේ දරන්නකු විසින් මෙහි උපලේඛනයේ දක්වා ඇති යම් වෛද්‍ය උපකරණයක් එහි දක්වා ඇති උපරිම සිල්ලර මිලට වඩා අඩු යම් මිලකට වර්තමානයේ දී විකුණනු ලබන විට ඔහු විසින් එහි මිල වැඩි කිරීමෙන් තොරව එහි පවත්නා මිල අඛණ්ඩව පවත්වාගෙන යා යුතු ය.


1A - PG 003391 — 807 (2017/08)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. වෙළඳ නාමයෙන් හෝ අනුමත නාමයෙන් මෙහි උපලේඛනයේ විස්තර කර ඇති යම් වෛද්‍ය උපකරණයක් අලෙවි කරන හෝ අලෙවිය සඳහා ඉදිරිපත් කරනු ලබන හෝ ඒ සඳහා අය කරන සෑම තැනැත්තකුම හෝ 2 වන නියෝගයේ දක්වා ඇති ආයතනයක් එම වෛද්‍ය උපකරණය වෙනම අයිතමයක් ලෙස දක්වමින් වෛද්‍ය උපකරණයේ වෙළෙඳ නාමය හෝ අනුමත නාමය සහ මිල පැහැදිලි ව දක්වන රිසිට්පතක් නිකුත් කළයුතු ය.

5. නිෂ්පාදිත හෝ විකිණීමට තිබෙන වෛද්‍ය උපකරණ තොගයේ අයිතමවල එක් එක් ඒකකයේ මෙහි උපලේඛනයේ දක්වා ඇති අදාළ උපරිම සිල්ලර මිල ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් එසේ වුව ද මෙම නියෝග පළ කරන ලද දිනයේ සිට දින හතළිස් පහක කාලසීමාවක් ඉකුත් වීමට පෙර අදාළ වෙළෙඳ ඇසුරුමේ හෝ ලේබලයේ මුද්‍රණය හෝ සළකුණු කළයුතු ය.

6. මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් නිෂ්පාදකයකු, ආනයනකරුවකු, බෙදාහරින්නකු, වෙළෙන්දකු, සැපයුම්කරුවකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු යම් වෛද්‍ය ආයතනයක් හෝ යම් වෛද්‍ය උපකරණ සන්තකයේ දරන තැනැත්තකු විසින් වරදක් සිදුකරනු ලබන අතර, 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ IV වන කොටස යටතේ ඔහුට එරෙහිව නඩු විභාග කරනු ලැබිය යුතු ය.

7. මෙහි උපලේඛනයේ දක්වා ඇති වෛද්‍ය උපකරණවල උපරිම සිල්ලර මිල සෑම සිල්ලර අලෙවිසලකම ප්‍රදර්ශනය කිරීම සෑම නිෂ්පාදකයකු, ආනයනකරුවකු, බෙදාහරින්නකු, වෙළෙන්දකු, සැපයුම්කරුවකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු යම් වෛද්‍ය ආයතනයක් සහ යම් වෛද්‍ය උපකරණ සන්තකයේ දරන්නකුගේ වගකීම විය යුතු ය.

8. මේ නියෝගවල -

"වෛද්‍ය වෘත්තිකයා" යන්නට (105 වන අධිකාරය) වූ වෛද්‍ය ආඥා පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

9. "පෞද්ගලික වෛද්‍ය ආයතනය" යන්නට 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

**උපලේඛනය**

| | අයිතමය | උපරිම සිල්ලර මිල (MRP) |
|---|---|---|
| 1. | ලෝහමය වටනේය (Bare Metal Stent) | රු. 24,000.00 |
| 2. | ඖෂධ මුදා හරින වටනේය (Drug Eluting Stent) | රු. 1,05,000.00 |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.